# සුදුවා

# සහ

# කළුවා



ඩබ්.ඩබ්.ඩී.දෙවන්ෂා

# සුදුවා සහ කළුවා

© කතෘ  ප්‍රකාශනයකි

පළමු මුද්‍රණය 2023 නොවැම්බර් 15

ISBN 978-624-206-900-5

කතාව සහ චිත්‍ර

**ඩබ්.ඩබ්.ඩී.දෙවන්ෂා**

2 E, මහමායා බාලිකා විද්‍යාලය

කතෘගේ වෙනත් කෘති

රතු පැංචා

නපුරු නංගි

## පිදුම..

මට අකුරු කියවූ මගේ ආදරණීය තාත්තාටත්,නිතරම මා ළඟින්ම සිටින ආදරණීය අම්මාට සහ මාගේ අක්කාටත්, මට අකුරු උගන්වා හොඳ නරක කියා දී, මෙවැනි නිර්මාණ කිරීමට මාව යොමුකල මාගේ ගුරුවරිය වන චාමිනී පල්ලියගුරු ගුරුතුමියටත් මාගේ පොත උපහාරයක්ම වේවා...

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශණයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්තකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක්වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතිකඅවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික ස්මාට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ගේ අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතටය එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන් මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන්අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.


ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර
2023.10.20

# ඔන්න ඉතිං යාළුවනේ අහසේ හිටියා සුදූවා සහ කළුවා කියලා වලාකුළු දෙන්නෙක්.






මේ දෙන්නා කොයි වෙලාවෙත් රණ්ඩු වෙනවා. ඔන්න ඔහොම කාලය ගෙවිලා යද්දි දවසක සුදුවට හිතුණා දේදුන්න තනියම එයාට අයිති කරගන්න.



මේ බව සුදුවා කළුවට කිවුවා.
ඊට පස්සේ මේ දෙන්නා
හොඳටම රණ්ඩු කරන්න පටන්
ගත්තා.

ඒ විතරක් නෙවේ හොඳටම
තරහ ආපු කළු වලාකුළු යාළුවා
සුදු වලාකුළු යාළුවාට අතට
එකක් ගැහුවා.





අනේ සුදූවට ඒ ගහපු පාර හොඳටම රිදිලා සුදූවා හයියෙන් අඬන්න පටන් ගත්තා.



සුදුවා අඬන සද්දය ඇසුණු ඉර මාමා ඉක්මණින්ම එතනට ආවා. මේ දෙන්නට කතා කළා.

"දරුවනේ, හොඳ යාළුවෝ කවදාවත්ම රණ්ඩු වෙන්නේ නෑ, ගහගන්නෙත් නෑ " කියලා කිවුවා.




ඊට පස්සේ ඉර මාමා සුදූවගෙන් ඇහුවා, දේදූන්නට පාට කීයක් තියනවද කියලා.

එයා කිවුවා හතයි කියලා.





"හරියටම හරි. එහෙනම් ඔය දෙන්න පාට හත දෙකට බෙදාගන්න. පාට හත දෙකට බෙදා ගත්තාම එක්කෙනෙකුට පාට තුනක් ලැබෙනවා, ඉතිරි එකයි. ඒක ඔය දෙන්නටම අයිතියි."



දැන් ඉතිං මේ දෙන්නට හරි සතුටුයි. ඉර මාමා දුන්න ඔවදන මතක් වුණා. කළුවා දුවල ගිහින් සුදුවව බදා ගත්තා. මට සමාවෙන්න යාළුවේ කිවුවා.



ඉතිං එදායින් පස්සේ මේ යාළුවෝ දෙන්නා ආයෙත් කවදාවත්ම තරහ වුණේනම් නෑ.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20